1978 7 - 14

# ජාතික රාජ්‍ය සභාවේ
# 1978 අංක 21 දරන
# ධර්මචක්‍ර විද්‍යාපීඨ සභා පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූනි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 ජූනි මස 30 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 30 යි　　තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 21 දරන ධර්මචක්‍ර
විද්‍යාපීඨ සභා පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූනි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 38/77

ධර්මචක්‍ර විද්‍යාපීඨ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ධර්මචක්‍ර විද්‍යාපීඨ සභා" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සභාවක්, එකී සභාවේ සාමාජිකයන් එකඟවන රීති අනුව, එකී සභාවට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවා තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සභාව විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සභාව සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 21 දරන ධර්මචක්‍ර විද්‍යාපීඨ සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන ඒ ධර්මචක්‍ර විද්‍යාපීඨයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් "ධර්මචක්‍ර විද්‍යාපීඨ සභා" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබාගෙන පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද විය යුතු ය. ධර්මචක්‍ර විද්‍යාපීඨ සභාව සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බුද්ධ ධර්මය පරියත්ති, පටිපත්ති, පටිවේධ වශයෙන් සාකල්‍යයෙන් අධ්‍යයනය කිරීම සහ ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම ;

(ආ) බුද්ධ ධර්මය අධ්‍යයනය කිරීම හා ඇදහීම වර්ධනය කිරීම, ධෛර්යමත් කිරීම හා ව්‍යාප්ත කිරීම ;

(ඇ) බුද්ධ ධර්මඥානය හා ඇදහීම ලොව සියලු කොටස්වල දියුණු කිරීම හා පතළ කිරීම ;

(ඈ) දැනට පවත්නා හෝ අනාගතයේ දී ඇති විය හැකි බෞද්ධ කටයුතු පිළිබඳ වැඩ පිළිවෙළක් හෝ බුද්ධ ධර්මය දියුණු කිරීම හෝ ව්‍යාප්ත කිරීම සඳහා වූ යම් කටයුතු ලොව කවර හෝ කොටසක පවත්වාගෙන යාම, වර්ධනය කිරීම හෝ ව්‍යාප්ත කිරීම;

(ඉ) බෞද්ධයන් අතර සමගිය සහ සහයෝගය වර්ධනය කිරීම;

(ඊ) බෞද්ධයන්ගේ කායික හා බුද්ධිමය වර්ධනය සහ ඔවුන්ගේ සංස්කෘතිය නංවාලීම හා දියුණු කිරීම;

(උ) සංස්ථාවේ අරමුණු සහ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව යටතේ හෝ වෙනත් යම් මණ්ඩලයක් සමග එක්ව හෝ, සංස්ථාවෙන් පරිබාහිරව හෝ ආයතන පිහිටුවීම, වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඌ) ඉහත සඳහන් අරමුණු හා පරමාර්ථ වර්ධනය කිරීමෙහි ලා අවශ්‍ය හා යෝග්‍ය වෙනත් සියලු පියවර ගැනීම.

කළමනාකාර සභාව.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීති අනුව තෝරා පත් කරගනු ලබන තැනැත්තන් ගණනකින් සමන්විත කළමනාකාර සභාවක් විසින් සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි ධුර දරන සභාවේ කළමනාකාර සභාවේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ නෙරපීම සඳහා ද, කළමනාකාර සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ද එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී වැඩි ඡන්දයෙන් රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සාදනු ලැබූ විට එවැනි ම රැස්වීමක දී ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව කළ හැකි වන්නේ ය.

(2) සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කර ගනු ලබන කිසිම රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම, හෝ පරිච්ඡින්න කිරීම කරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද එකී වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළමනාකාර සභාව විසින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දිනයෙහි බලපවත්නා සභාවේ රීති මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයන් තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සභාව විසින් ගෙවිය යුතු ණය හා සභාවට ගෙවනු ලැබිය යුතු ණය.

6. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පවත්නා සභාවේ සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර සභාවට අය විය යුතු සියලු ණය හා ගෙවනු ලැබිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. කළමනාකාර සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට අතිරේකව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු මුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හෝ දැරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව තිබිය යුතු අතර එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සහ සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව එකී සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

ණය ගැනීමේ බලතල.

9. ස්වකීය පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් මුදල් ලබාගැනීම සහ එම කාර්යය සඳහා යම් උකස්, බැඳුම්කර හෝ බැඳීම් සංස්ථාව විසින් ඇති කිරීම, ක්‍රියාවෙහි යෙදීම, ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුව ද සංස්ථාව විසින් එසේ ලබා ගත හැකි මුදල්වල එකතුව කළමනාකාර සභාව විසින් නිශ්චය කරනු ලබන මුදල නොඉක්මවිය යුතු ය.

ආපසු ගෙවීම.

10. සංස්ථාව වෙනුවෙන් සහ එහි ප්‍රතිලාභය සඳහා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, අනුයෝජිතයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද ගෙවීම්වල ප්‍රමාණයට සංස්ථාවේ ඒ සාමාජිකයාට, නිලධරයාට, අනුයෝජිතයාට හෝ සේවකයාට සංස්ථාව විසින් ඒ මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.